# වේදිකාවේ රඟපෑ අක්කාට පසුබිම් ගී ගැයූ මල්ලී

ඒ.ඩී. රන්ජිත් කුමාර - ලංකාදීප

ඉඳුරුවේ කයිකාවල උපන් වෝල්ටර් විජේසේකර කුඩා කාලයේ සිටම දක්ෂ චිත්‍ර ශිල්පියකු, මූර්ති ශිල්පියකු ලෙස ප්‍රතිභාව දැක්වූ කලාකරුවෙකි. ඔහුට ගායන හැකියාවත් පිහිටා තිබුණි. 1934 වසරේ ලංකාවට පැමිණි මහා කලාකරු රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ දේශනයක් අසා පැහැදුන වෝල්ටර් එතුමාගේ ශාන්ති නිකේතනයට යාමට සිහින මැව්වේය. කල්කටාවේ ශාන්ති නිකේතනයට ගිය ඔහු තාගෝර්තුමා හමුවී ආශීර්වාදය ලබා ලෝක ප්‍රකට චිත්‍රශිල්පී නන්දලාල් බෝස්ගෙන් චිත්‍ර කලාවද, උදය ශංකර් (රවි ශංකර් නම් ලෝ පසිඳු සංගීතඥයා ගේ වැඩිමහල් සොහොයුරා) යටතේ නර්තන කලාවත් ඉගෙන ගත්තේය. එකල වෝල්ටර්ගේ ශාන්ති නිකේතනයේ සමකාලීන සිසුන්ව ඇත්තේ සත්‍යජිත් රායි හා ලයනල් එදිරිසිංහයන්ය.

ශාන්ති නිකේතනයේදී චිත්‍ර කලාවත්, නර්තනයත් මැනවින් ඉගෙන පෙරළා ලංකාවට පැමිණි වෝල්ටර් තෝරාගෙන ඇත්තේ කලාවට හාත්පසින්ම වෙනස් රජයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරි තනතුරය. ඔහු විවාහ වූයේ කොළොන්නාවේ මීතොටමුල්ල ගර්ට්රූට් ඩේසි නම් යුවතියයි.

"අපට පුතෙක් ලැබුණොත් තාගෝර්තුමා මතක් වෙන්න රවීන්ද්‍ර කියලා නම තියනවා" වෝල්ටර් තම බිරියට කීවාය.

එහෙත් මේ යුවළට ලැබුණේ දියණියකි. ඇය දේවිකා නම් වූවාය. දේවිකාට පසු 1948 මාර්තු 14 වැනිදා සහෝදරයෙක් පවුලට එකතු විය. මේ පිරිමි දරුවාට ගුරුදේව තාගෝර්තුමා සිහිකරමින් නමක් තැබුවේය.

රවීන්ද්‍රනාත් ලක්ෂ්මන් ද අල්විස් විජේසේකර.


පසුගියදා ජීවිතයෙන් සමුගත් ප්‍රවීණ ගායක, ටෙලිනාට්‍ය අධ්‍යක්ෂ, ටෙලිනාට්‍ය රංගවේදී, චිත්‍රපට හා ටෙලිනාට්‍ය සංගීත අධ්‍යක්ෂ, සංගීත ගුරුවරයකු වූ වචනයේ පරිසමාප්ථාර්තයෙන්ම මානව හිතවාදියකු, නිරහංකාර මිනිසාගේ මතක සුවඳ නම් නොමැකෙන්නේය. මීට වසර දෙකකට පමණ පෙර ගල්කිස්සේ ටෙම්ප්ලර්ස් පාරේ කලාපුර නිවසේදී අප ආදරණීයව කතා කරන "ලකී" සමග නිවී හැනහිල්ලේ ඔහුගේ සුවඳුක් විමසද්දී කතා කිරීමට ලැබුණි.

"මගේ තාත්තා මූර්ති ශිල්පියෙක්, නර්තන ශිල්පියකු මෙන්ම චිත්‍රශිල්පියකු වුවත්, සංගීතඥයකු නොවුණේ ඇයිදැයි මට හිතාගන්න බෑ. මට යමක් තේරෙන කාලේ උදේ අවදිවෙන කොට ඇහෙන්නේ තාත්තා කියන මේ සින්දුව.

"ඇයි තරහෙන් මාන්නකාරි
පලා දුවන්නේ
දමලා මා මෙහි
ඉවසිලිවන්ති කෝප නොවෙවී
ශාන්තදාන්ත වේ
කෝපෙ නෑ නෙත බැලුවම තීගේ
සන්සුන් ලීලාවෙන්
තිබේ සැදී සුබාව සේවේ
එපාය මිතුරි ගැන සංචල්
සකි එපාය මිතුරී ගැන සංචල්..."

තාත්තා කියන ගීතය කොතරම් අසා තිබුණා ද යත් මට බහ තේරෙන කාලයේම තාලයට කටපාඩමින් කියන්න පුළුවන් වුණා. මම ඒ සින්දුව කියන කොට අම්මයි, තාත්තයි හොරෙන් හැංගිලා අහගෙන ඉඳලා තියෙනවා. දේවිකා අක්කාට පසු පවුලේ දෙවැනියා මම. ඊට පස්සේ ශේෂනාත්, අශෝක් නාත්, රාජ්නාත්, ජනකනාත්, නිශාන්ති, චූලාංගනී සහෝදර සහෝදරියන් හය දෙනෙක් හිටියා."

ලක්ෂ්මන් මුලින්ම ගාල්ලේ බොනවිස්ටාවෙන් ඉගෙන අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට ගොස් ඇත. කුරුණෑගල මලියදේව විද්‍යාලය ඔහුගේ කලා ජීවිතය ආලෝකමත් කළ



*ප්‍රවීණ සංගීතඥයකු වූ අභාවප්‍රාප්ත ලක්ෂ්මන් විජේසේකරයන්ගේ අවසන් කටයුතු 14 දා ගල්කිස්ස පොදු සුසාන භූමියේදී සිදු කෙරිණි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.*

තක්ෂිලාවක් වී ඇත. ගායකයකු ලෙස ලක්ෂමන් කැපී පෙනුණි. ඔහු සී.ටී. ප්‍රනාන්දුගේ ගීත සති අන්තයේ පැවැත්වෙන සමිතියේ ගැයීම නිසා 'පොඩි සී.ටී.' නම පටබැඳී ඇත.

"ඒ කාලයේ මලියදේව විද්‍යාලයේ විදුහල්පති කර්නල් ඊ.ඒ. පේරුසිංහ මහතා. (පසුව කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති) දැඩි විනය පාලකයෙක්. අපිට සංගීතය ඉගැන්වූ කේ.ඒ. දයාපාල සර් මගේ ගායන හැකියාව වර්ධනය කරන්න උදව් කළා. මට විශේෂ පන්ති පැවැත්තුවා. මට වඩා ඉහළ පන්තියක සිටි ටී.එම්. ජයරත්නත්, මේ සංගීත පන්තියට ආවා. ඉස්කෝලේ යන කාලේ මම නළුවෙක් වෙන්න ආසාවෙන් හිටියෙ. මලියදේව පිරිමි පාසලක් නිසා පාසල් නාට්‍යවල මම රඟපෑවේ කාන්තා චරිත." තම අතීත කතාව කීවේය.

ලක්ෂ්මන් ගේ දේවිකා විජේසේකර අක්කා 1963 වසරේදී "අංගුලිමාල" වේදිකා නාට්‍යයේ රඟපෑවාය. අක්කා රඟපෑවේ අහිංසකගේ පෙම්වතී හැටියට. රණසිංහ නම් මහතෙක් නිෂ්පාදනය කරමින් අංගුලිමාල ලෙස රඟපෑ මේ නාට්‍යය ඒ කාලයේ තිබුණ 'විසිතුර' පත්තරේ අනුග්‍රහයෙන් කොළඹ විහාර මහා දේවි එළිමහන් රංග පීඨයේ රඟදැක්විය. එදා මේ නාට්‍යයේ අක්කා වෙනුවෙන් පසුබිම් ගායනා කළේ ලක්ෂ්මන් මල්ලී වීම විශේෂයකි. එදා හැමෝම කතාකර ඇත්තේ කාන්තා හඬකින් කන්කළු ලෙස ගී ගැයූ මල්ලී ගැනලු.

ලක්ෂ්මන්ගේ ලොකු තාත්තා (පියාගේ එක කුස උපන් සහෝදරයා) වූයේ මෙරට සිටි සංස්කෘත භාෂා විශාරදයකු වූ මහාචාර්ය ඕ.එච්. ද ඒ. විජේසේකර ය. කොළඹ විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයකු වූ ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු සංස්කෘත මහාචාර්යවරයකු හා භාෂා පීඨාධිපතිවරයෙකි. මහාචාර්ය විජේසේකරගේ පුතුන් වූයේ දොස්තර ගාමිණී විජේසේකර (එක්සත් ජාතික පක්ෂයේ ලේකම්, මහරගම අතුරු මැතිවරණයට තරග කරද්දී ත්‍රස්තවාදී බෝම්බයකින් ඔහු මිය ගියේය) හා විශේෂඥ ස්නායු රෝග ශල්‍ය වෛද්‍ය ජගත් විජේසේකරය. ලක්ෂ්මන්ගේ මව රෙදිවලින් සැරසූ ලස්සන චිත්‍ර රටා නිර්මාණයේ ප්‍රවීණතා දැක්වූ කලා ශිල්පිනියකි. තම මව විසින් නිර්මාණය කළ සිතුවම් රටා ලක්ෂ්මන්ගේ නිවසේ බිත්ති අලංකාර කරමින් වැජඹෙයි. මවගේ එක කුස උපන් සොහොයුරිය එනම් ලොකු අම්මාගේ දියණිය ප්‍රීති සෙනෙවිරත්න (රන්දෙනිය) ප්‍රකට කිවිදියකි. රංගවේදියකි. ඇය විවාහ වී සිටින්නේ සම්මානනීය රංගවේදී රවීන්ද්‍ර රන්දෙනිය සමගයි.

ලක්ෂ්මන් විජේසේකරයන් රජයේ සංගීත විද්‍යාලයට (අද සෞන්දර්ය විශ්වවිද්‍යාලය) ඇතුළත් වන්නේ 1968 වසරේදීය. ඔහුගේ පන්තියේ සිටි මිතුරු මිතුරියන් වූයේ රෝහණ වීරසිංහ, ආනන්ද වීරසිරි, මාලිනී බුලත්සිංහල, බන්දුල විජේවීර, බණ්ඩාර අතාවුද ආදීන්ය. සංගීත උපාධිය ලබා අනුරාධපුර තම්මැන්නා වේළුසුමන විද්‍යාල්‍ය, විජයපුර ආදර්ශ විද්‍යාල්‍ය, ඉසිපතන විද්‍යාලය හා කොළඹ ඩී.එස්. සේනානායක ආදී විද්‍යාලවල සංගීත උපදේශකවරයකු ලෙස සේවය කර ඇත.

"මම මුලින්ම ප්‍රසිද්ධ වේදිකාවේ රඟපෑවේ 'විරෝදාන' නාට්‍යයේ. මේ නාට්‍යය රචනය කළේ කුසුම් දිසානායක (මහාචාර්ය ජේ.බී. දිසානායකගේ බිරිය) විසින්. සංගීතය අධ්‍යක්ෂණය කළේ සංගීත විශාරදයකු වූ සදානන්ද පට්ටිආරච්චි සර්. මම රඟපෑවේ සිද්ධාර්ථ චරිතය. බියට්‍රිස් බටපොල යශෝධරාගේ චරිතය. නාට්‍යය වේදිකාගතවීමට තිබුණේ දින තුනයි. මට ඇස් රෝගය හැදිලා රඟපාන්න බැරිව ගියා. පට්ටිආරච්චි සර්ගේ වාදක මණ්ඩලයේ හිටිය මගේ හොඳම මිතුරෙකු වූ රෝහණ වීරසිංහත් හිටියා.

"ලක්ෂ්මන්, හරි වැඩේනේ, දැන් තියෙන තත්ත්වය නිසා වෙන විකල්පයක් මට හිතා ගන්න බැහැ. තව දවස් තුනයි තියේන්නේ. අපි මොකද කරන්නේ?"

"සර් අපි රෝහණට කියමු මගේ චරිතය රඟපාන්න කියලා. එයා රඟපාන්නත් දක්ෂයි."

රෝහණ නාට්‍යයේ සංවාද, ගීත පදමාලා හොඳින් දැන සිටියා. එයා අපේ යෝජනාවට කැමති වුණේ යශෝදරාවට රඟපෑ බියට්‍රිස් බටපොල (පසුව රෝහණගේ බිරිය) සමඟ තිබූ ප්‍රේම සම්බන්ධය නිසා. රෝහණ ඉතා හොඳින් රඟපෑවා. රෝහණ හා බියට්‍රිස් රඟපෑවේ එකම එක වරක් පමණයි. දෙවැනි දර්ශනයේ ඉඳලා මම බියට්‍රිස් එක්ක දිගටම රඟපෑවා."

තම පියා ගෙදරදී ගැයූ "ඇයි තරහෙන් මාන්නකාරි" ගීතය ලක්ෂමන්, විසින් රෝහණ වීරසිංහයන්ගේ නව සංගීත නිර්මාණය යටතේ නැවත ගැයීය. ඔහුගේ මුල්ම සරල ගීතය වූයේ නිර්මලා රණතුංග සමග ගැයූ මේ ගීතයයි. රචනය කළේ කුමාරදාස සපුතන්ත්‍රීය. සෝමපාල රත්නායක සංගීතය සංයෝජනය කළ මෙම ගීතය අතිශයින් ජනප්‍රිය විය.

"ඔබ මට තරුවකි ගනඳුරු රැයකදි
දිදුලන සඳ ලෙස ගුවන අරා
ළා හිරු මඬලයි මා අබියස ඔබ
බැස යන්නේ නැති සසර පුරා..."

තමාගේ මිතුරකු වූ කිංස්ලි රාජසිංහ තනුව නිර්මාණය කළ කුමාරදාස සපුතන්ත්‍රී රචනා කළ මේ ගීතය ලක්ෂමන්ගේ ගායන ලෝකය මංසලකුණකි.

"දෑත දෙපාලන ගිගිරි සරින්
මා කැඳවා නොතැවෙන්
සිව්සිය ගව්දුර ඇදෙන ලෙසින්
සෝක සුසුම් නොහෙලන්..."

රෝහණ වීරසිංහගේ සංගීතයට ලක්ෂ්මන් ගැයූ නිර්මාණ 1975 සිට 1980 දක්වා සංගීත අඹරේ දිදුළුනේය. ගීත රචනය වසන්ත කුමාර කොබවකය.

"ඇති දේ ඇති සැටියෙන් ලොව දකින මිනිස්සු
ලද දේ සිත සතුටින් විඳ වෙසෙන මිනිස්සු
පොරණේ මිහි සයනේ ගොඩ නැගූ මිනිස්සු
කරුමේ කිම වඳ වෙන හිරු සදිසි මිනිස්සු..."

ලක්ෂ්මන්ගේ කලා ජීවිතයේ අමුතු පෙරළියක් ඩී.බී. නිහාල්සිංහගේ 'රේඛා' ටෙලිනාට්‍ය සමඟය. 'රේඛා' පටන් ගැනීමට සැලසුම් කර තිබූ කාලයේ නිහාල්සිංහයන් මහාචාර්ය සුනිල් ආරියරත්නයන් අධ්‍යක්ෂණය කළ 'මූදු ලිහිණි' චිත්‍රපටයේ කැමරාව මෙහෙයවමින් සිටියේය. ටෙලි නාට්‍යයේ ගීත රචනය පවරා තිබුණේ සුනිලුන්ටය.

"මිස්ටර් නිහාල්සිංහ අපි 'රේඛා' ටෙලිනාට්‍යයට අලුත් සංගීත අධ්‍යක්ෂවරයෙක් හඳුන්වා දෙමු."

☞ 24 වෙනි පිටුවට.....